**රාජ්‍ය ඔෘෂධ නීතිගත සංස්ථාව - 2022**

**--------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
---------------------------------------------------------------------------

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 178.82 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වසරේ මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල ද අවසන් වාර්තාව ගිණුම් පිළියල කිරීමට ප්‍රථම අප වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි.<br>2023 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු පාරිතෝෂිත ගිණුමේ වටිනාකම රු. මිලියන 17.76 ක් අඩුවෙන් හා වැටුප් පාලන වෙන්කිරීම් ගිණුමේ වටිනාකම රු. මිලියන 16.38 ක් වැඩියෙන් දක්වා.තිබුණි | ගෙවිය යුතු සේවක පාරිතෝෂික දිගුකාලයක් රඳවා නොගන්නා බැවින් වැටුප් පාලන ගිණුම හරහා ම අදාල ගෙවීම් සිදුකිරීම අපගේ ගිණුම් ප්‍රතිපත්තිය වේ. මෙහි ගෙවිය යුතු පාරිතෝෂිත ගිණුමේ වටිනාකම රු. 76,247 ලෙස දක්වා ඇත්තේ පැරණි ශේෂයකි. රු. මිලියන 1.38 ක වටිනාකම ගිණුම්ගත වී නොමැත. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් දිනට රාජ්‍ය 31 ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතු වුවද, ඉතිරි තොගවල පිරිවැය නිශ්චිතව හඳුනානොගෙන තොග හුවමාරු වටිනාකමින් සියයට කට 7 .සමාන රුමිලියන 65.01 ක් පමණක් නොඉපයූ ලාභ ලෙස වෙන් කර තිබුණි. | ප්‍රධාන ගබඩාවෙන් ඔසුසල වලට මාරුකල ආනයනික ඖෂධ වලින් වසර අවසානයේ ඉතිරිව ඇති තොගයේ හුවමාරු වටිනාකම නිවැරදිව ගණනය කිරීම සඳහා නිර්මිත වූ පරිගණක පද්ධතියක් සංස්ථාව සතුව නොමැත. සංස්ථාව විසින් ඔසුසල සාමාන්‍ය තොගයෙන් හුවමාරු ප්‍රතිශතය ඉවත්කර ලබාගත් ඇස්තමේන්තුගත ක්‍රමවේදයකට වසර අවසානයේ ඉතිරිව ඇති තොගයේ හුවමාරු වටිනාකම ගණනය කරන අතර එය විගණනය විසින් ද පිළිගෙන වසර ගණනාවක සිට ක්‍රියාත්මකව තිබුණි. | ඔසුසැල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනා ගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතුය. |

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු ශේෂය | 51,591.79 | 47,604.57 | 3,987.22 | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු රු.මිලියන 51,591.79 ක ණයගැති ශේෂයන් රු.මිලියන 211.59 ක් පොත්වලින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි රු.මිලියන 51,380.2 | වෛද්‍ය සැපයුම් අංශය සමඟ ශේෂ සැසඳුම් පිළියෙල කර අදාළ වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | වූ ශේෂය මේ වන විට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු ශේෂය හා සංසන්දනය කරමින් පවතී. | කළ යුතුය. |
| (ආ) | 1996 සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ඔසුසල් මගින් අලෙවි කිරිම සඳහා මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම් වලින් 2022 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වී තිබුණු වෛද්‍ය සැපයීම්වල පිරිවැය | 344.23 | 324 | 20.23 | මෙම වෙනස ඇතිවීමට හේතු සොයා බැලීම සඳහා විධිමත් විනය පරීක්ෂණ පවත්වන ලද අතර ඒ අනුව අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ . | වෙනසට හේතු හඳුනා ගැනීමට අවශ්‍ය ගැලපීම් කිරීමට හා අදාළ පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළ දී විකුණුම් වටිනාකම් අදාළ වෙළඳ ණයගැතියන්ගෙන් අයකර ගත යුතු වුව ද 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,488.41 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය තුළ පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 28.47 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හා රු.මිලියන 29.11 ක් වර්ෂ 1 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි. වර්ෂ 5 කට වඩා පැරණි රු.මිලියන 10.44 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. | වෙළඳ ණයගැතියන්ගෙන් ණය අය කර ගත යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,488.41 ක් වූ ණය ශේෂය තුල, වර්ෂ 5 කට වැඩි පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.මිලියන 28.47 එලෙසම පවතී. එහි පාර්ලිමේන්තු සංකීර්ණයෙන් අයවිය යුතු ණයගැති වටිනාකම වූ රු.මිලියන14.62 ද අනිකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 2.37 ද නීතිමය පියවර ගත් රු.මිලියන 10.44 ක ණය ශේෂයද ඇතුලත්ය. | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව ණය අයකර ගත යුතු කාලසීමාව තුල හා ගිවිසුම් ප්‍රකාරව ණය අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු | දක්වා ඇති රු.මිලියන 211 ශේෂ ලියාහැරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි | පැරණි ණය ශේෂ පියවා ගැනීමට හෝ විධිමත් ලෙස |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 51,591.79 කින් රු.මිලියන 211.59 ක් වර්ෂ 10 ත් වර්ෂ 24 ත් අතර හා රු.මිලියන 3,253.05 ක් වර්ෂ 6 ත් වර්ෂ 15 අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණිඉහත . දක්වන ලද වර්ෂ10 ත් වර්ෂ 24 ත් අතර පැරණි රු. මිලියන 211.59 ක් පොත්වලින් ලිහා හැරීමට ඉල්ලුම් කර ඇති ශේෂයක් බව නිරීක්ෂණය විය. | රු.මිලියන 51,380.2 ක් වූ ශේෂය මේ වන විට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු ශේෂය හා සංසන්දනය කරමින් පවතී. | කපා හැරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අත්තිකාරම් රු. මිලියන 424.42 කින් රු.මිලියන 1.05 ක් වසර 7 ත් වසර 15 ත් අතර කාලයක සිට හා රු.මිලියන 4.31 ක් වසර 3 ත් වසර 5 ත් අතර කාලයක සිට අයකර ගැනීමට තිබූ ශේෂයන් විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සැපයුම්කරුවන් වෙත නිකුත් කර ඇති නමුත් නිරවුල් කර නොතිබුණු අත්තිකාරම් නියමිත කාලසීමාව තුලදී නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් දිනට ගෙවිය 31 යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 19,538.15 කින් රු.මිලියන 909.18 ක් වර්ෂ කට වඩා 2 වැඩි කාලයක සිට සැපයුම්කරුවන් වෙත නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020.12.31 දක්වා ඇති ගෙවූ මුදල් හිලව් කිරීමට හෝ ආදායම් ගත කිරීමට මේ වනවිට කටයුතු කර ඇත. | දීර්ඝ කාලයක් තුළ සැපයුම්කරුවන්ට නොගෙවූ වටිනාකම් පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ හා 756 (2) 757 | ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර එම සමීක්ෂණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ වාර්තා 2023 මැයි 16 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සියළු ඔසුසල වල ස්ථාවර වත්කම් සමීක්ෂණය කර වාර්තා පිළියල කර ඇති අතර ප්‍රධාන කායීලයේ වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් අදියරේ පවතී. අවසන් වාර්තාව පිළියල කල වහාම විගණනය වෙත ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2022 අප්‍රේල් 26 දිනැති 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනිමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ 51 වන සංවත්සරය වෙනුවෙන් රන් පවුම් සහ මුදල් තෑගි ගෙවීම සඳහා සේවකයන් 54 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 3.72 ක වියදමක් දරා තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය යටතේ වසර 03 ක් සඳහා ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සාමූහික ගිවිසුම තුලින් වැටුප් නොවන මෙතෙක් හිමිවී ඇති ප්‍රතිලාභ ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යාමට අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක පීඊඩී 08/2019 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 ඡේදය | සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ මැදිහත්ව ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීමට උත්සාහ කල බවත් එසේ කිරිමේදී මතුවුන ප්‍රායෝගික ගැටලු හේතුවෙන් එම කටයුත්ත සම්පූර්ණ කිරීමට නොහැකි වූ බවත්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි මට්ටමින් මේ සඳහා ක්‍රියා කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි | | | |
| | (i) 4.3 ඡේදය | ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීම හා ආයතනයේ ක්‍රියාකාරීත්වයට බලපාන අවදානම් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සංස්ථාව විසින් අවදානම් කළමනාකරණ කමිටුවක් පත්කළ යුතු වුවද, 2023 මාර්තු 31 දින වන විටත් එම කමිටුව පත් කර නොතිබුණි. | සංස්ථාවට පවතින අවදානම් හඳුනා ගැනීම සඳහා උපදේශන සේවාවක සහය ලබාගත යුතු බවට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන ඇති අතර මෙම වසර තුල උපදේශන සේවාවක සහය ලබාගෙන අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 අප්‍රේල් මස 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(x) ඡේදය | මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් තාවකාලිකව අත්හිටවිය යුතු බව දක්වා තිබුණ ද ඉන් බැහැරව ආපදා ණය ලෙස මාණ්ඩලික නිලධාරීන් 26 දෙනෙක් සඳහා රු.මිලියන 6.5 ක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට අත්තිකාරම් ගිණුම් යටතේ මුදල් සපයනු නොලබන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 08/22 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉතිරි නිවාඩු මත දීමනා ගෙවීමේදි සේවකයන්ට හිමි නිවාඩු 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කල යුතු වුවද ඉන් බැහැරවසමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 49.34 ක් ඉතිරි අසනිප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය යටතේ වසර 03 ක් සඳහා ක්‍රියාත්මක ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සාමූහික ගිවිසුම තුලින් අදාල අනුමැතිය ආවරණය වී ඇත. එමගින් මෙතෙක් ලබා දී ඇති ප්‍රතිලාභ ඒ ආකාරයෙන්ම නොවෙනස්ව පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 09/22 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | සාමුහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයන් හට ප්‍රසාද දීමනා නොගෙවිය යුතු වුවත් ඉන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එක් සේවකයකුට රු.20,000 බැගින් රු.මිලියන 17.82 ක් ප්‍රසාද දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය යටතේ වසර 03 ක් සඳහා ක්‍රියාත්මක ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සාමුහික ගිවිසුම තුලින් රජයේ අනුමත වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවීම සඳහා අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 931.58 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 2,416.42 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 1,484.84 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම සියයට 58 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ එන්නත් ආනයනික ආදායම පිළිවෙලින් රු.මිලියන 13,887.48 ක් හා රු.මිලියන 141.47 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම ආදායම සියයට 99 කින් අඩු වී තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මධ්‍ය මිලදී ගැනීම් ඒකකය හරහා මිලදී ගැනීම් වලට අදාල ආදායම පිළිවෙලින් රු.මිලියන 2,765.07 ක් හා රු.මිලියන 65.45 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම ආදායම සියයට 98 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 1.06 කින් වැඩි වීමක්ද, ශුද්ධ ලාභ අනුපාතය සියයට 1.57 කින් අඩු වීමක්ද, ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 0.85 කින්ද අඩු වී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 181 කින් වැඩි වී තිබුණි. මේ පිළිබඳව අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව විසින් ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරිම සඳහා 2007 වර්ෂයේ දී තීරණය කර තිබූ අතර 2023 වර්ෂය වන විට වසර 17 ක් ඒ සඳහා ගත කර තිබූ නමුත් එම අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂයන්හි දී රු.මිලියන 32.36 ක් වටිනා පරිගණක උපාංග අයිතම 09 කින් ඒකක 497 ක් මිලදී ගෙන තිබුණු අතර ඒවායින් පිරිවැය රු.මිලියන 2.55 ක් වූ පරිගණක හා උපාංග ස්ථාවර වත්කම් අයිතම 04 කින් ඒකක 36 ක් 2023 මාර්තු 17 දින වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ඒ සඳහා මිලදී ගත් පරිගණක උපාංග අවශ්‍යතාවය අනුව ආයතනයේ වෙනත් අංශ සඳහා භාවිතා කරමින් පාඩුවක් සිදු නොවීමට කටයුතු කරන බව | නිශ්කාර්යව පවතින වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සැපයුම්කරුවන් වෙත ගෙවීම් විධිමත් කිරීම සඳහා පිහිටුවා තිබුණු කමිටුව මගින් නිර්දේශ කරනු ලබන සැපයුම්කරුවන්ට නිර්දේශිත සීමාවන් තුළ පමණක් ගෙවීම් සිදුකළ යුතු වුවද සංස්ථාව විසින් අවසන් වරට 2022 ජූනි 08 වන දින පවත්වා තිබූ 65 වන කමිටු තීරණයට පටහැනිව 2022 සැප්තැම්බර් 02 දින වන විට සැපයුම් සමාගම් 05 කට එකතුව රු. මිලියන 525.25ක් ගෙවීම් සිදුකර තිබුණි. | • මෙම ගෙවීම් සභාපතිවරයාගේ හා සාමාන්‍යාධිකාරිවරයාගේ අනුමැතිය මත ගෙවීම කර ඇති අතර එම ගෙවීම් සම්බන්ධ වාර්තා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කර ඇත.<br>• එම ගෙවීමේ දී වසර දෙකහමාරකට වැඩි කාලයක් ගෙවීම් නොකළ හා සපයන ලද අයිතමය සැලකිල්ලට ගෙන ඇත .<br>• එක් ආයතනයකට ගෙවීම් සඳහා Global Fund Project මගින් මිලියන 60.69 මුදලක් ලබා දී ඇත. | සැපයුම්කරුවන්ට විධිමත් ක්‍රමවේදයකට අනුව ගෙවීම් කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිරාකරණය නොවූ තොග ලෙස හඳුනාගත් ඉන්ඩෙන්ටු 16 ක වටිනාකම වූ රු.මිලියන 155.16 | අදාළ තොග අපහරණ කටයුතු 2023/05/18 වන දින සිට ආරම්භ | අපහරණ කටයුතු කඩිනම් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ක් සඳහා වූ මුළු ගොඩබෑමේ පිරිවැය ලෙස රු.මිලියන 169.81 ක් අදාල සැපයුම්කරුවන්ගෙන් අයකර ගෙන ඇති බවත්, රු. මිලියන 21.59 ක් වූ ඉන්ඩෙන්තු 03 ක තොග විනාශ කිරීමට 2020 ජූනි 14 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී තිබූ නමුත් විගණිත දින වන විටත් එම තොග විනාශ කර නොතිබූ අතර, ඒ සඳහා සංස්ථාවට අමතර පිරිවැයක් දැරීමට ද සිදු වී තිබුණි. | කිරීමට කටයුතු යොදා ඇති බව | කටයුතු කළ යුතුය. |
| (ආ) | වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරිමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනිමට 2022 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.මිලියන 3,405.08 ක හරපත් සඳහා රු.මිලියන 1,529.83 ක් විගණිත දිනය වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට අසාදු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු ව තිබූ රු.මිලියන 306.11 ක් අය කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | හරපත් වටිනාකමින් රු.මිලියන 54.19 ක මුදලක් 2023/04/26 දින වන විට සැපයුම්කරුවන්ගෙන් අය කර ගෙන ඇත. ගෙවීම පැහැර හැරීම නිසා රු.මිලියන 692.78 ක හරපත් සඳහා අදාල වන සැපයුම්කරුවන් අසාධු ලේඛන ගත කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව, රු.මිලියන 20.89 ක වටිනාකමකින් යුතු හරපත් 2013 වසරට පෙර සැපයුම් වෙනුවෙන් නිකුත් කරන ලද හරපත් ලෙස නිර්ණය කර අයකර ගත නොහැකි බව, රු.මිලියන 9.31 ක වටිනාකමකින් යුතු හරපත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශය මත සංශෝධනය කිරීමට නියමිත බව, රු.මිලියන 14.12 ක මුදලක් සංස්ථාව සමඟ ගනුදෙනු නොකරන සැපයුම්කරුවන්ගෙන් අයවිය යුතු බව, රු.මිලියන 131.92 ක වටිනාකමින් යුතු හරපත් වල අගය බැර කර ගැනීම් තාවකාලික අත්හිටුවා ඇති බව. | මේ වන විට අයකර නොගත් මුදල් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන වලට අනුව සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය රු.මිලියන 344.23 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය රු.මිලියන 60.40 ක් විය.ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධ වල මුළු පිරිවැය | සෑම මූල්‍ය වර්ෂයකම අදාල තත්ත්වයෙන් අසමත් කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල විස්තර ඇතුලත් වාර්තාවක් අළෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත අදාල ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරනු ලබයි. | තත්ත්වයෙන් අසමත් ඖෂධවල වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමටත් ඖෂධ කල් ඉකුත් වීමට හේතු සොයා බලා පිළියම් යෙදීමටත් හා එම හේතු වලට වගකිව යුතු |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 32.29 කින් රු.මිලියන 23.68 ක් 2023 මාර්තු 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත් වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදු වූ මුළු අලාභය රු.මිලියන 156.50 ක් වී තිබුණි. | | පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබූ තොග අතරින් රු.මිලියන 265.88 ක වටිනාකමින් යුත් අයිතම 19 ක් තත්ත්වයෙන් අසමත් වී තිබූ අතර ඉන් අයිතම 11 ක් සඳහා රු.මිලියන 177.70 ක හරපත් නිකුත් කර තිබුණ ද, ඉන් රු.මිලියන 146.61 ක මුදලක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | හරපත් නිකුත් කිරීමේ හා අයකර ගැනීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | තත්ත්වයෙන් අසමත් ඖෂධ වල වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය
--------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | ------------------------ | -------------- |
| (අ) | වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.225 ක් වටිනා Trastuzumab (440 mg) එන්නත් ඒකක 500 ක් මිලදී ගැනිමට අදාලව තෝරාගත් ලංසුකරු විසින් ලංසුව සමග ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ආයතනය සඳහා නිකුත් කල සහතිකයක් නොවූ අතර ඖෂධ නිෂ්පාදන , සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් සියලු මිලදී ගැනීම් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නතර කරන ලෙස දැනුම් දුන් ආයතනයක් වෙත නිකුත් කර තිබූ සහතිකයක් විය. එමෙන්ම ඉදිරිපත් කර තිබූ ලියාපදිංචි සහතිකයද කල් ඉකුත් වී තිබුණි. ලංසු මිල ගනන් ඇගයූ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුනේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කිරීමට යටත්ව පමණක් අවම මිල ඉදිරිපත් කල ලංසු කරු වෙත ලංසුව පිරිනැමීමට වුවද, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය නොසලකා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් නොකල ලංසුකරු වෙත අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණි. | මිලදී ගනු ලබන ආයතනයට බලය පවරනු ලබන ලේඛනයක් ලංසුව සමඟ ඉදිරිපත් කර ඇති බවත්, ඖෂධ නියාමන අධිකාරිය ප්‍රකාශයට පත් කල නිවේදනයක් මඟින් ලංසුවේ වලංගු කාලය දීර්ඝ වී ඇති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ සමඟ එකඟ වීම හා නොවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ බලයක් ඇති බව | ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය සහිත සැපයුම්කරු වෙත ලංසුව පිරිනැමීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2016, 2017 හා 2018 වර්ෂ සඳහා පිරිවැය රු.මිලියන 35.76 ක් වු Furosemide Injection BP 20 mg/2 ml එන්නත් මාත්‍රා ඒකක 5,845,000 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබූ එන්නත් මාත්‍රා 99,000 ක තොගය භාරගැනිමේදි නිරික්ෂණය වු අඩුපාඩු හේතුවෙන් මෙම තොගය පිළිගත නොහැකි බවත් ඒ සඳහා නිෂ්පාදන ස්ථායිතා වාර්තාව (Product Stability Report) සපයන ලෙස සැපයුම්කරු වෙත කරන ලද දැනුම් දීම මත සැපයුම්කරු විසින් Accelerate Stability Report සපයා තිබූ අතර එහි සඳහන් ආකාරයට අදාල ඖෂධ අවශ්‍ය ප්‍රමිත සහ පිරිවිතර වලට අනුකූල බවට නිෂ්පාදක සමාගමෙන් දැනුම් දී තිබුණි. එහෙත් එසේ දැනුම් දුන් ලිපි ශීර්ෂ නිෂ්පාදන සමාගම භාවිතා කරනු ලබන ලිපි ශිර්ෂ වලට වඩා සකස් කරන ලද ලිපි ශිර්ෂයක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඇනවුම් කරන ලද මුළු ඒකක ප්‍රමාණයට අදාලව නිෂ්පාදන සමාගම විසින් වරින් වර නිකුත් කරන ලද එන්නත් විශ්ලේෂණ සහතික වල තත්ත්ව පාලන කළමණාකරුගේ අත්සන් හා ආකෘතිය ද එකිනෙකට වෙනස් වුවද එම වෙනස්කම් පිළිබද ප්‍රසම්පාදන අස්ථිත්වය කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ප්රසම්පාදන කමිටුව සිය ඇගයීම් වල දී ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතුය. |
| (ii) | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියවිලි දත්තවලට අනුව ඉහත සැපයුමට අදාලව සැපයුම්කරු විසින් ලංසු ලේඛන වල සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නිෂ්පාදකයාගෙන් නොවන වෙනත් ආනයන සමාගම් දෙකක් මගින් එන්නත් මාත්‍රා 3,898,900 ක් ආනයනය කර තිබුණු අතර එම සමාගම් දෙකම ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි සමාගම් නොවන බව නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී අදාළ වන අණපනත් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) | සැපයුම්කරු විසින් සපයා තිබූ මෙම එන්නත සම්බන්ධයෙන් රජයේ රෝහල් 2 ක් හා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වලට අදාලව පරික්ෂණ සිදු කළ ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාරයේ (NMQAL) පරීක්ෂණ වාර්ථාවට අනුව පරීක්ෂා කල එන්නත් Sterility පරීක්ෂණයේ දී බ්‍රිතාන්‍ය ඖෂධීය පිරිවිතර වලට අනුකූල නොවන බවට හා පරීක්ෂාව සඳහා ලැබී තිබූ එන්නත් සාම්පල්වල හා ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාර (NMQAL) වෙත ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගොනු තුල අන්තර්ගත වූ නිෂ්පාදිතයේ ආදර්ශ ඇසුරුම්වල එකිනෙකට වෙනස් විෂමතාවයක් නිරීක්ෂණය විය.මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල මත මෙම එන්නත වහා භාවිතයෙන් ඉවත්කරන ලෙස රජයේ සියළු රෝහල් සහ ආයතන වෙතද, පෞද්ගලික වෙළදසැල් තුළින් ඉවත් කරන ලෙස අදාළ සමාගම වෙතද දැනුම් දී තිබුණි. එම දැනුවත් විම කරන විටත් 2018 හා 2019 වර්ෂවලට අදාල තොගවල කල් ඉකුත්වීමේ දින ඉක්මවා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීමෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අධිහාර කළ යුතුය. මෙම ප්‍රසම්පාදනය |
| (iv) | මෙම ඉන්ඩෙන්ටු වලට අදාල තොගවල නිෂ්පාදක වශයෙන් ප්‍රසම්පාදන ලියවිලි හා රේගු නිශ්කාෂණ ලියවිලි වල සඳහන් වු නිෂ්පාදිත සමාගම අදාල කාලසීමාව තුල මෙම | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරු වෙත කිසිදු අයිතමයක් නොසැපයූ බවත් මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව තමන්ගේ කිසිදු දැනුවත් භාවයක් නොමැති බවත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙනුවෙන් වෝහාරික විගණනයක් සිදුකල ආයතනය විසින් විගණනය වෙත ලිඛිතව තහවුරු කල ද අදාල ප්‍රසම්පාදන ලිපිගොනුව තුලවූ ලිපි සහ විශ්ලේෂණ සහතික නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ මගින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද එම ලිපි ශීර්ෂ 2015 ජූනි 10 දින නිෂ්පාදිත සමාගම විසින් සැපයුම්කරු තම ශ්‍රී ලාංකික නියෝජිතයා ලෙස පත් කල බව දක්වමින් ලංසු ලේඛන සමග ඉදිරිපත් කරමින් රූපලාවන්‍ය උපකරණ සහ ඖෂධ (Cosmetic Devices and Drug) අධිකාරිය වෙත එවා තිබුණු ලිපි ශීර්ෂයන්ට වඩා හාත්පසින්ම වෙනස් ලිපි ශීර්ෂ විය. | | |
| (v) | කොළඹ ජාතික රෝහලෙන් ලබාගත් ඇසුරුම් වලට අදාලව සිදු කල භෞතික පරීක්ෂාවට අනුව මෙම එන්නත ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබූ ආදර්ශ ඇසුරුම් හා වෛද්‍ය සැපයුම් අංශය වෙත ලැබී කොළඹ ජාතික රෝහල තුල ඉතිරි වී තිබූ ඇසුරුම් වල විවිධ වෙනස්කම් නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |
| (vi) | ඉහත කරුණු හේතුවෙන් සැපයුම්කාර සමාගම අසාදු ලේඛණ ගත කිරීමට නීති අංශය වෙත යොමු කර තිබුණද අවශ්‍ය කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |
| (ඇ) | පිරිවැය රු.මිලියන 1.49 ක් වූ Ceftriaxone Sodium for Injection BP 500mg ඒකක 79,500 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති සැපයුම්කරුවෙකු මගින් මිලදී ගෙන තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන ලියවිලි වලට අනුව සහ ආනයනයේදී රේගු දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර තිබූ ලියවිලිවලට අනුව එන්නතෙහි නිෂ්පාදක වශයෙන් සඳහන් කර තිබූ සමාගමෙන් තොරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණු සමාගමක් මගින් ඖෂධ ආනයනය කර තිබුණි සැපයීම් අංශයට සපයන ලද සැපයුම්කරු විසින් වෛද්‍ය. තොගය සම්බන්ධයෙන් ජාතික ඖෂධ ආරක්ෂණ පරීක්ෂණාගාරයේ සිදු කරණු ලැබූ තත්ත්ව පරීක්ෂණයේ දී USP ලේබල් අවශ්‍යතාවය සහ දැනට පවත්නා ලේබල් වල දක්නට ලැබුණු ලක්ෂණ අතර පැවති වෙනස්කම් හේතුවෙන් අදාල භාණ්ඩ වල තොග භාවිතයෙන් ඉවත් කරන ලෙස දැනුම් දී තිබුණි . අවශ්‍ය පිරිවිතර නොගැලපීම නිසා භාවිතයෙන් ඉවත් කල තොග වෙනුවෙන් වැය වූ පිරිවැය ආපසු ගෙවන ලෙස සංස්ථාව විසින් සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණ ද ඒ බව පිළිනොගත් සැපයුම්කරුව අසාදු ලේඛන ගත කිරීමට කටයුතු නොකර සැපයුම්කරුගේ අත්හිටුවා තිබූ ගෙවීම්වලින් ගුණාත්වයෙන් තොර ඖෂධ සැපයීම හේතුවෙන් දැරූ රු.මිලියන 1.86ක පිරිවැය අඩුකර 2022 අගෝස්තු, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී රු.මිලියන 273.6 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධව විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය ඔසුසැල් වල අලෙවිය සඳහා Diclofenac Potassium Tablates (50mg) ඖෂධයෙන් (5x10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 48,000 ක් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ ඇනවුමට අදාලව තෝරාගත් සැපයුම්කරුට ඇසුරුම් ඒකකයක් එක්සත් ජනපද ඩොලර් 0.248 බැගින් එක්සත් ජනපද ඩොලර් 11,904 කට ඇනවුම ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම හා ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා දින 167 ක කාලයක් ගතවී තිබුණි.එමෙන්ම සැපයුම්කරු තෝරා ගන්නා අවස්ථාව වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ එම සැපයුම්කරුගේ ලියාපදිංචිය අවසන් ව තිබුණද එය දීර්ඝ කර ගැනීම සඳහා දින 258 ක කාලයක් ගත වීම ඇනවුමේ ප්‍රමාදයට ප්‍රධාන හේතුව වී තිබුණි. එමෙන්ම ලංසුකරු විසින් 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචිකර ලියාපදිංචි සහතිකය සංස්ථාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂයේ මුල් මාස 5 හි මෙම ඖෂධයේ මාසික සාමාන්‍ය අලෙවිය ඒකක 5000 ක් වූ අතර 2021 ජූනි මස සිට රාජ්‍ය ඔසුසැල් තුල මෙම ඖෂධය හිග වී පැවතුණි. ඒ හේතුවෙන් 2021 ජූනි සිට 2022 අගෝස්තු මස දක්වා සංස්ථාවට අහිමි වූ මුළු අලෙවිය දළ වශයෙන් රු.මිලියන 9.75 ක් විය.මෙම ඖෂධය රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙතින් ද නිෂ්පාදනය කරණු ලැබුවද එමගින් මිලදී ගෙන හෝ ඔසුසැල් තුල පවත්නා ඖෂධ හිගය පියවීම කෙරෙහි සංස්ථාවේ අවධානය යොමු වී නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කළ යුතුය. |
| (ඉ) | රාජ්‍ය ඔසුසල්වල අලෙවිය සඳහා Etoricoxilo Tablats 60(mg) ඖෂධයේ ඇසුරුම් ඒකක 30,000 ක් මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම දෙවන හා අවම පස්වන ලංසු කරුවන් වෙත පිළිවෙලින් ඇනවුමෙන් සියයට 25 හා සියයට 75 ක් වශයෙන් ලංසුව පිරිනමා තිබුණි. කෙසේ නමුදු දෙවන අවම මිලට වඩා සියයට 153 ක මිල වැඩිවීමක් සහිත පස්වන ලංසු කරුට මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් ප්‍රදානය කිරීමට සාධාරණ හේතුවක් විගණනයට නිරීක්ෂණය නොවීය.එමෙන්ම මෙම අයිතමයේ අවම මිල හා උපරිම මිල අතර ඒකකයක රු. 345 ක මිල වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 128 කි.මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් දෙවන අවම ලංසුකරුගෙන් බැහැරව පස්වන අවම ලංසුකරුට ප්‍රදානය කිරීම හේතුවෙන් සංස්ථාවට අතිරේක පිරිවැයක් ලෙස රු.මිලියන 6.2 ක් දැරීමට සිදුවීමෙන් අවම මිලට ඖෂධ සැපයීම වූ සංස්ථාවේ අරමුණින් ද බැහැර වී තිබුණි. එම ඖෂධය ඔසුසැල් තුල හිගව පැවති කාලය දින 329 ක් වී තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | රාජ්‍ය ඔසුසැල්වල අලෙවි කිරීම සඳහා Cetrize Syrup 5mg/5ml Bottle වලින් ඇසුරුම් ඒකක 150,000 ක් මිලදී ගැනීම සඳහා 2020 ජූනි 26 දින ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම මිල ලෙස ඒකකයක් රු. 29.25 ඉදිරිපත් කල ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොමැති බව සඳහන් කරමින් ඒකකයක් රු. 71.30 ක මිලක් ඉදිරිපත් කල දෙවන අවම | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත |

| | | | |
|---|---|---|---|
| | ලංසුකරුට ඒකකයක් රු. 69.93 කට ඇනවුම ප්‍රදානය කර තිබුණ ද අවම ලංසුකරුගේ ලංසු ලේඛන තුල ලියාපදිංචි සහතිකය ඉදිරිපත්කර තිබුණි.අවම ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කරවාගෙන හෝ අවම ලංසුකරුට මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු නොකිරීමෙන් සංස්ථාවට රු.මිලියන 6.06 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර ඒ හේතුවෙන් මෙම ඖෂධයේ ගැනුම් පිරිවැය අවම ලංසු වටිනාකමට වඩා සියයට 138 ක ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබුණු අතර අවම මිලට ඖෂධ සැපයීමේ අරමුණින් ද බැහැර වී තිබුණි. සැපයුම්කරු ඖෂධ ඒකක 99,000 ක් සැපයීමට කටයුතු නොකිරීම හේතුවෙන් රාජ්‍ය ඔසුසැල් තුල තොග නොමැති තත්ත්වයක් ඇති වී තිබුණි. | | යුතුය. |
| (ට) | සංස්ථාවේ තොග හා පාලන කළමණාකරුගේ ගැණුම් අධියාචනාවකට අනුව Clonazepam Tablets (0.5mg) යන ඖෂධයෙන් ඇසුරුම් ඒකක 48,000 (25x10)ක් රු.මිලියන 20.07 ක පිරිවැයකට මිලදී ගැනීමට අදාලව අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙත 2020 සැප්තැම්බර් 04 දින නිකුත් කල ඉන්ඩෙන්ඩුවට අදාලව පළමු ඖෂධ තොගය 2021 පෙබරවාරි 08 දින හා අවසන් තොගය 2022 ජනවාරි 12 දින ගබඩාව වෙත ලැබී තිබුණි. ගැණුම් ඇණවුම පිළියෙල කරන අවස්ථාව වන විටත් මෙම ඖෂධයේ මාස 4 කට පෙර තොග අවසන් වී තිබුණු අතර මෙම ඖෂධයේ යලි ඇනවුම් තොග මට්ටම පිළිබඳ අවධානයක් යොමු නොකර ඇනවුම් කිරීම හේතුවෙන් අඛන්ඩව මාස 3,4 ක් රත්මලාන ගබඩාවේ තොග නොමැති තත්ත්වයකට පත් වී තිබුණි. ඖෂධයේ විකුණුම් පුරෝකතනය අනුව වාර්ෂික අවශ්‍යතාවට අනුකූල පරිදි හා තොග ශුන්‍යව පවතින බැවින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූලව හැකි ඉක්මනින් ඖෂධ මිලදීගත යුතු වුවත් ගැනුම් ඇනවුම ඉදිරිපත් කල දින සිට මුළු ඖෂධ ප්‍රමාණය ගබඩාව වෙත ලැබීම සඳහා වර්ෂ 2 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. 2018 සිට 2022 වර්ෂය දක්වාම එක සැපයුම්කරුවෙකු ගෙන් මෙම ඖෂධය මිලදී ගෙන තිබුණු අතර ඉන්ඩන්ටුවේ සඳහන් දිනයන්ටම ඖෂධ සපයා ගැනීමට සංස්ථාව අපොහොසත් වීම තුලින් 2019 මාර්තු සිට 2022 අගෝස්තු දක්වා අවස්ථා 6 කදී අඛන්ඩව මාස දෙකකට වැඩි කාලයක් ඖෂධයේ අලෙවිය ශුන්‍ය වී තිබුණු බැවින් එම කාලපරිච්ඡේදය තුල සංස්ථාවට අලෙවි ආදායමක්ද ලැබී නොතිබුණි. | මෙම තොග මාස කිහිපයකට ප්‍රමාණවත් පරිදි ඔසුසැල ගබඩා තුල තොග මට්ටම පවත්වා ගත් අතර මාස කිහිපයක් ප්‍රධාන ගබඩාවේ තොග ශුන්‍ය වුවත් ඔසුසැල් වල මෙම ඖෂධය ප්‍රමාණවත් පරිදි පවතී. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ එම ඖෂධ ප්‍රමාණයද ගබඩා වෙත ලැබීම ප්‍රමාද විය. අහඹු ලෙස තෝරා ගත් ඔසුසැල් කිහිපයක තොග වාර්තා අනුව ඖෂධයේ හිඟයක් වාර්තා වන්නේ නැත. | යළි ඇණවුම් තොග මට්ටම පිළිබඳ අවධානය යොමු කරමින් ගබඩාවට අවශ්‍ය ඖෂධ තොග ඇණවුම් කළ යුතුය. |
| (ඨ) | වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය මත Cefotaxime Injection USP 1g එන්නත් කුප්පි 250,000 ක් දේශීයව මිලදී ගැනීම සඳහා රු. 70.70 ලෙස අවම මිල ඉදිරිපත් කල ලංසුකරුට ඇනවුම සැපයිය හැකි කාලසීමාව දීර්ඝ බව සඳහන් කරමින් මෙම ඇනවුම අවලංගු කර නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව ඒකකයක මිල රු. 540 ක් ලෙස ඉදිරිපත් කර තිබූ ලංසු කරු සමග මිල සාකච්ඡා කර (එන්නත් 65,000 නොමිලේ සැපයීම මත) එන්නතක ඵලදායී මිල ලෙස රු. 399.60 කට මිලදී ගැනීමට එකඟ වී තිබුණි. එන්නත් කුප්පියක ඇස්තමේන්තු ගත මිල රු. 45.71 ක් ද පළමුව තෝරාගත් සැපයුම්කරුගේ ඒකකයක මිල රු. 70.70 ක් ද වූයෙන් තෝරාගත් | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

සැපයුම්කරුගේ මිලේ පිළිවෙලින් සියයට 774 හා සියයට 465 ක වැඩිවීමක් විය. දෙවන අවස්ථාවේ තෝරාගත් ලංසුකරු පළමු අවස්ථාවේදීද මිල ගනන් ඉදිරිපත් කර තිබූ අතර එහි මිල රු.235 ක් වුවද මාස 2 කට වඩා අඩු කාලයකදී දෙවන වර කැඳවීමේදී ලංසුකරු විසින් මිල රු. 540 ක් ලෙස තීරණය කර තිබීම කෙරෙහි ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබද අවධානය යොමු නොකර ඇනවුම ප්‍රදානය කර තිබුණි. දෙවන ලංසු කැඳවීමේදී තෝරාගත් සැපයුම්කරු වෙත 2019 දෙසැම්බර් 13 දින වන විට ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණ නමුත් පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් අවම මිල ඉදිරිපත් කල ලංසුකරු විසින් දින 45 ක් ඇතුලත එන්නත් ඒකක 250,000 සපයන බව ප්‍රකාශ කර තිබූ නමුත් එය ප්‍රතික්ෂේප කර නැවත වරක් ලංසු කැඳවා තිබුණ ද තෝරාගත් සැපයුම්කරු දින 30 ක් ඇතුලත ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි.

(එ) වෛද්‍ය සැපයුම් අංශය විසින් 2016 අප්‍රේල් 01 දින ඉදිරිපත් කර තිබුණු ගැණුම් අධියාචනාවට අනුව Ipratropium Pressurized Inhalation BP 20 Mcg/Puff ඖෂධයෙන් ඒකක 130,000 ක් රු.මිලියන 91.70 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | මෙම ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා තුනකදී ලංසු කැඳවීම් සිදුකර තිබුණු අතර පළමු අවස්ථාවේදී සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ඩුව නිකුත් කර ණයවර ලිපි විවෘත කර තිබියදී වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂකගේ දැනුම් දීමකට අනුව පළමු තොගය මාස 09 ක් හා දෙවන තොගය මාස 13 ක් ප්‍රමාදව සැපයීම කරන ලෙස දැනුම් දීම මත අදාල සැපයුම ප්‍රමාදකල නොහැකි බව සැපයුම්කරු දන්වා තිබුණි. සැපයුම්කරු ඖෂධ සැපයීමට එකග වූ දිනට පසුව නිෂ්පාදනයේ ඇතිවූ කාර්මික දෝෂයක් හේතුවෙන් ඖෂධ සැපයිය නොහැකි බව පසුව දැනුම් දී තිබුණි. ඖෂධ සැපයීමේ කොන්දේසි වලට අනුව මෙම ප්‍රසම්පාදනය හදිසි කටයුත්තක් ලෙස සීමිත ලංසු කැඳවා හැකි ඉක්මනින් ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතු බව දන්වා සිටියද ඖෂධය මාස 09 ක් ප්‍රමාද කර ලබාගත යුතු බව දන්වා සිටීම තුලින් මෙම සැපයුම හදිසි අවශ්‍යතාවයක් නොවන බව නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |
| (ii) | ප්‍රසම්පාදනයට අදාළව තුන්වන ලංසු කැඳවූ අවස්ථාවේ ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබූ නමුත් ලියාපදිංචි සහතිකය නැවත ලබාගැනීම මත හා 1987 අංක 03 දරණ පොදු ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි සහතිකය ලබාගැනීමේ කොන්දේසි වලට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් 2017 සැප්තැම්බර් 29 දින ඒකකයක් රු.705.40 ක් බැගින් ඒකක 130,000 ක් සඳහා රු.මිලියන 91.70 ක් වූ වටිනාකමට ඇනවුම ප්‍රදානය කර තිබුණද ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය |

| | | | |
|---|---|---|---|
| | තිබුණු ඉන්වොයිසිවලට අනුව සැපයුම්කරු විසින් ඖෂධ ඒකකයක් රු.14.13 බැගින් ඒකක 130,000 ක් රු.මිලියන 1.84 ට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවුනු සමාගමකින් මෙරටට ආනයනය කර සියයට 4892 ක වැඩි මිලකට වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණි. සැපයුම්කරු විසින් නිෂ්පාදිත ඖෂධ ආනයනය කර තිබුණේ ලංසු ලේඛණවල සඳහන් නොවන නිෂ්පාදන සමාගමක් මගිනි. | | සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අධිහාර කළ යුතුය. මෙම |
| (iii) | සැපයුම්කරු වෙත 2017 ඔක්තෝම්බර් 20 ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණද වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයිමට පෙර ඒම ඖෂධ වල ඇසුරුම, ලේබලය හා රාජ්‍ය ලාංඡනය සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එම තොරතුරු වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. එමෙන්ම ඇණවුමට අදාල පළමු තොගය (ඒකක 6500) ආනයනය කළ දින සිට වෛද්‍ය සැපයීම් අංශය වෙත සැපයීම සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) | 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 106(1) වගන්තියට පටහැනිව සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ආනයනය කරන ලද මෙම ඖෂධය ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගෙන් තොරව වෙනත් නිෂ්පාදකයෙකු මගින් මෙරටට ආනයනය කර ඖෂධ ඇසුරුම් වල ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගේ විස්තර මුද්‍රණය කර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |
| (v) | සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද ඖෂධය ලියාපදිංචි කිරිම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිගොණුවේ ඇතුලත් ඖෂධයේ ආදර්ශ ඇසුරුම් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දී තිබුණු ඖෂධයේ ඇසුරුම් තුල රෝගී උපදෙස් පත්‍රිකාවේ ඇතුලත් තොරතුරු හා ඖෂධ ලේබලයේ ඇතුලත් තොරතුරු අතර හා සැපයුම්කරු විසින් ලංසු ලියවිලි ඉදිරිපත් කිරීමේදී නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ යටතේ දේශීය නියෝජිතයා පිළිබඳ ප්‍රකාශ, අනුකූලතා ලිපි හා අදාල ඖෂධයේ විශ්ලේෂණ සහතික සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණු අතර එම ලිපි ශීර්ෂ වල ද නොසැසඳීම් නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | |
| (vi) | මෙම ප්‍රසම්පාදනය හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා දින 09 ක් වැනි කෙටිකාලයක් තුලදී ලංසු කැඳවා තිබූ නමුත් ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරු විසින් මෙම තොග සැපයීම සඳහා මාස 5 ත් 8 ක් දක්වා වූ කාලයක් ප්‍රමාද වී තිබූ නමුත් ඒ සඳහා ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ගිවිසුම් කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ 07 ස්ථානගත කර ඇති ඔසුසල සඳහා විදුලි සෝපාන යන්ත්‍රයක් සවිකිරිම වෙනුවෙන් 2015 වර්ෂයේදී ගෙවීම් කළ රු.මිලියන 0.72 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නොනිමි වැඩ යටතේ දක්වා තිබුණ ද වසර 07 ක කාල සීමාවක් ගත වී ඇතත් මෙම විදුලි සෝපානයේ වැඩ අවසන් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අත්තිකාරම් ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි (i) 2.3 ඡේදය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2021 – 2025 කාලය සඳහා සකස් කර ඇති ආයතනික සැලැස්මෙහිම කොටසක් වශයෙන් දක්වා ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |